:1* (i) ව්‍යවසායකයෙකුගේ සුවිශේෂී ගති ලක්ෂණයකි, නිර්මාණශීලීත්වය. ඔහුට එය වර්ධනය කර ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද?

(ii) ව්‍යවසායකයෙකුට ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අවශ්‍ය ප්‍රාග්ධනය සම්පාදනය කරගත හැකි මාර්ග කවරේද?

(iii) ව්‍යවසායකයෙකු ලෙස ඔබට වෙළෙඳපළට ප්‍රවේශ විය හැකි විකල්ප මාර්ග කවරේද?

(iv) ව්‍යාපාරයක් ආරම්භ කරන්නෙකුට තම නිෂ්පාදිත වෙත පාරිභෝගිකයා ආකර්ෂණය කර ගැනීම පිණිස අනුගමනය කළහැකි උපාය මාර්ග කවරේද?

(v) යෝග්‍ය ව්‍යාපාර අවස්ථාවක් තෝරා ගැනීමේ ආරම්භක පියවර කුමක්ද? ඊට හේතුව කවරේද?

:2* (i) ව්‍යවසායකයෝ පරිසරයේ ඇති සම්පත් කාර්යක්ෂමතාවයෙන් යුතුව භාවිතා කරමින් නිර්මාණශීලී ව්‍යාපාර අවස්ථා මතුකර ගැනීමට දක්ෂයෝය. මේ සඳහා ශ්‍රී ලංකාව තුළ පවතින එවැනි ස්වභාවික සම්පත් මොනවාද?

(ii) ව්‍යවසායකයා ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී ඒ සඳහා ප්‍රමාණවත් ඉපයීමක් අපේක්ෂා කරන්නේ ඇයි?

(iii) නව නිපැයුමක් සඳහා ලබා ගන්නා ස්වාධිකාරයක වලංගු කාලය කොපමණද?

(iv) ශ්‍රී ලංකාව තුළ කුඩා ව්‍යාපාර ආශ්‍රිතව දැකිය හැකි ශක්තීන් කවරේද?

(v) නිදහස් අධ්‍යපානය ලබා දෙමින් ඔබට මේ දක්වා අධ්‍යාපන මාවතේ ගමන් කිරීමට පහසුකම් ලබාදුන් ජාතික වශයෙන් ප්‍රසිද්ධියට පත් සමාජයීය ව්‍යවසායකයා කවුද?